සැ. යු.-2011.07.29 දින පළ වූ අංක 1,717 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,718 - 2011 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2011.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1132 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1133 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අගෝස්තු මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1129- B 80247— 8,905 (2011/08)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 සැප්තැම්බර් මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජූලි මස 12 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කළුතර | මිල්ලනිය | පැල්පොල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ හා රයිගම කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම්, කාර්යාලය, කළුතර. |

08-18

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 සැප්තැම්බර් මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජූලි මස 19 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මහනුවර | අකුරණ | උඩගම්පහ අංක 01 කොට්ඨාසයේ උප්පැන්න මරණ හා හාරිස්පත්තුව විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | පාතහේවා -හැට | ගම් දහය දකුණ අංක 02 | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| | | උප්පැන්න මරණ හා පාතහේවාහැට විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර යටිනුවර කොට්ඨාසයේ හියාරාපිටිය ප්‍රදේශයේ අතිරේක විවාහ | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| | | (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | මහනුවර. |
| මහනුවර | දෙල්තොට | දෙල්තොට පාතහේවාහැට කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

08-127

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2011

ආයුර්වේද සිසු හෙද පුහුණුවට බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අධ්‍යාපන සුදුසුකම් :

(අ) පැරණි විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උ.පෙළ) විභාගයට එකවර පෙනී සිට විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 04 ම සමත්ව තිබීම හෝ නව විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උ. පෙළ) විභාගයට එකවර පෙනී සිට විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 3 ම සමත්ව තිබීම ;

සහ

(ආ) අ.පො.ස. (සා. පෙළ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ, ගණිතය හා විද්‍යාව යන විෂයයන් ද ඇතුළුව සම්මාන 04 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම. අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉහත විභාග දෙකෙහි සහතිකවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

02. අනෙකුත් සුදුසුකම් :-

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

(ආ) 2011.01.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ඇ) උස අඩි 04 අඟල් 10 ට නොඅඩු විය යුතුය.

(ඈ) අවිවාහක විය යුතුය.

(ඉ) පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන්ගේ දූ දරුවන් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී අදාල අයදුම්කරුගේ මව/පියා පාරම්පරික වෛද්‍යවරයකු බවට සනාථ කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ සහතිකයක් හා ග්‍රාම නිලධාරීගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ.

03. අයදුම් කළ යුතු ක්‍රමය :-

(අ) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව 13" x 8" ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කළ යුතු වේ.

(ආ) අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙළවරේ "ආයුර්වේද සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීම - 2011" යනුවෙන් සඳහන් කොට 2011.08.30 දින හෝ ඊට පෙර "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න මහරගම" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේ දී නැතිවීම හා ප්‍රමාදවීම පිළිබඳ වග කියනු නොලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන සේවයේ/රජයේ ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වාර්ෂිකව රු. 240,360 කට නොඅඩු ආරම්භක වැටුපක් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු හෝ එබඳු තනතුරක් දරන ලද රජයේ විශ්‍රාමිකයකු විසින් අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුය.

04. තෝරා ගැනීමේ ක්‍රමය හා පුහුණු කිරීමේ පරිපාටිය :-

(අ) අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් විවෘත ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලබන අතර ඉන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තරඟ විභාගය සඳහා පහත සඳහන් විෂය නිර්දේශයට අනුව සකස් කළ පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට සියළු අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය.

විෂයය නිර්දේශය :- බුද්ධි පරීක්ෂණය
සාමාන්‍ය දැනුම
විෂයානුබද්ධ දැනුම

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයේ දී ද ලකුණු ලබාදෙන අතර තරඟ විභාගයේ ලකුණු හා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු අනුව අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලකුණු ලබා දෙන පරිපාටිය පහත සඳහන් පරිදි වේ.;

1. වෘත්තීය දැනුම හා පළපුරුද්ද,
2. පාරම්පරික වෛද්‍යවරයෙකුගේ දරුවන් සඳහා උපරිමය ලකුණු 30 ක්,
3. පෞරුෂත්වය.

තෝරාගත් අයදුම්කරුවන් ආයුර්වේද සිසු හෙද/හෙදියන් වශයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සිංහල/දෙමළ මාධ්‍යයෙන් පවත්වන අවුරුදු 03 පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරිය යුතුය.

(ඇ) පුහුණුව සඳහා ඇතුළත් කර ගන්නා අවස්ථාවේ අභ්‍යාසලාභීන් වෙත ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි බල පැවැත්වෙන නීති රීති මාලාවක් සපයනු ලැබේ. මෙම නීති රීති වලට හා කලින් කල පනවනු ලබන වෙනත් නීති රීති වලට ද ඔවුන් යටත් වනු ඇත.

(ඈ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාග වලින් අසමත් වන හෝ පුහුණු කටයුතු හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

පුහුණු කාලය තුළ දී අභ්‍යාසලාභීන් කිසිම ආකාරයක නිවාඩුවකට හිමිකම් නොලබන අතර, පුහුණුව සඳහා නොපැමිණි දින වෙනුවෙන් දීමනාවෙන් සමානුපාතික මුදලක් අඩු කරනු ලැබේ. කෙසේ වෙතත් විභාගයට පෙනී සිටීම සඳහා සෑම වර්ෂයකම 80% ක පැමිණීම අනිවාර්ය වේ.

(ඉ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට පහත සඳහන් පරිදි දීමනා ගෙවනු ලැබේ.

1. පළමු අවුරුද්ද - මාසිකව රු. 12,920
2. දෙවන අවුරුද්ද - මාසිකව රු. 13,040
3. තෙවන අවුරුද්ද - මාසිකව රු. 13,160

(ඊ) පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැර ගියහොත් පුහුණු කාලය තුළ ඔහුට හෝ ඇයට ගෙවනු ලබන දීමනා සහ රජය විසින් පුහුණුව සඳහා දරන ලද වියදම් සඳහා වැය වූ මුදල ඔහු හෝ ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. මේ සඳහා සනාථ කළ හැකි වාර්ෂික ආදායම රු. 300,000 ක් හෝ ඊට වැඩි ආදායමක් ලබන ඇපකරුවන් දෙදෙනෙකු සමග අයදුම්කරු විසින් ගිවිසුමක් අත්සන් කළ යුතු වේ.

05. *විවාහ නොවීමේ කොන්දේසි හා ගිවිසුම් :-*

(අ) සියළුම අයදුම්කරුවන් ඉල්ලුම්පත්‍රය එවන අවසන් දිනය වන විට අවිවාහකව සිටිය යුතු අතර, පුහුණුව ලබන තුන් අවුරුදු කාලය තුළ දී අවිවාහකව සිටීම අනිවාර්ය වේ. අවිවාහක බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් අයදුම්පත සමග අමුණා එවිය යුතු වේ.

(ආ) සිසු හෙද/හෙදියන් හෙද පුහුණු ඒකකයට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, එම පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව සේවයෙන් විශ්‍රාම යන තෙක් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් ආයුර්වේද කොමසාරිස් සමග ගිවිසුමකට ද එළඹිය යුතුය. ආයුර්වේද කොමසාරිස් විසින් මෙම කාල පරිච්ඡේදය කලින් කලට නිශ්චය කරනු ඇත.

06. *සේවා නියුක්ත කරවීමේ නියමයන් :-*

(අ) ඉහත පරිදි පුහුණුවෙන් පසුව පැවැත්වෙන අවසන් විභාගයේ ප්‍රතිඵල මත III ශ්‍රේණියේ හෙද තනතුරට අදාල වැටුප් පරිමාණය මත තනතුරුවල පුරප්පාඩු ඇති වන පරිදි ආයුර්වේද කොමසාරිස් විසින් පත්වීම් දෙනු ලැබේ.

(ආ) හෙද තනතුරට පත් කිරීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර එය විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වේ.

07. සේවා කොන්දේසි හා වැටුප් ක්‍රමය :-

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි එම්ටී - 7-2006 පරිදි රු. 15,080 - 5 x 150 - 9x 240 - 7 x 240 - 20 x 320 - 26,420 වැටුප් පරිමාණය මත හෙද නිලධාරි III ශ්‍රේණියේ තනතුරු වලට පවත්නා පුරප්පාඩු සඳහා පත් කරනු ලැබේ.

(ආ) හෙද සේවයේ සියළුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට ද, ආයුර්වේද හෙද ව්‍යවස්ථාවේ කොන්දේසි වලට ද, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්ති වලට අනුව කරන ස්ථාන මාරුවීම් වලට ද, මුදල් හා වෙනත් රෙගුලාසි වලට ද, රජය විසින් වරින් වර පනවනු ලබන නීති රීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

පී. එස්. කේ. ආර්. වීරකෝන්,
ආයුර්වේද කොමසාරිස්,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

ආදර්ශ අයදුම් පත්‍රය

*සිසු හෙද හෙදියන් පුහුණුව සඳහා බඳවා ගැනීම*

විභාග අංකය :- [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

විභාගයට පෙනී සිටින මාධ්‍යය :- [ ]

සිංහල - S දෙමළ - T

(අදාල අක්ෂරය කොටුව තුළ ලියන්න)

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.
02. තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.
03. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්) :————.
(ii) දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :————.
04. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය (ii) විවාහක/අවිවාහක භාවය

| | |
|---|---|
| පුරුෂ | |
| ස්ත්‍රී | |

| | |
|---|---|
| විවාහක | |
| අවිවාහක | |

අදාළ කොටුවේ (✓ ) යොදන්න

06. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

අදාළ කොටුවේ (✓) යොදන්න

07. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

08. උස : අඩි :—————. අඟල් :—————.

09. (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (විද්‍යා විෂය ධාරාව)

(ලකුණු පිටපත් ද අමුණන්න.)

*වර්ෂය :—————. විභාග අංකය :—————.*

| *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* | *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|---|---|---|---|---|
| 1.<br>2. | | | 3.<br>4. | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය :

*පළමු වාරය :*

(i) *විභාගයේ වර්ෂය හා මාසය :————.* (ii) *විභාග අංකය :————.*

| *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* | *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|---|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. | | | 7.<br>8.<br>9.<br>10.<br>11.<br>12. | | |

*දෙවන වාරය :*

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* | *විෂයය* | *ශ්‍රේණිය* | *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|---|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. | | | 7.<br>8.<br>9.<br>10.<br>11.<br>12. | | |

10. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත්ද?

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

ඔව් නම් විස්තර සපයන්න. :————.

11. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මවිසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දැන සිටිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන …………………… මහතා/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2011 ………… වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.

නිල මුද්‍රාව :—————.

*සහතික කරන නිලධාරියාගේ*

සම්පූර්ණ නම :—————.

තනතුර :—————.

ලිපිනය :—————.

08-61

---

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010 (II)

1.0 2004.12.24 දිනැති හා අංක 1372/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 5.2 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2011 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ නිලධාරීන් සඳහා මෙම විභාගය, කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවල දී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවැනි මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුරය | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුරය | 13 |
| කිලිනොච්චිය | 14 |

3.0 (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *සුදුසුකම්* .– රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

5.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2011 සැප්තැම්බර් මස 05 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

6.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව*.– අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අනන්‍යතාව විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

7.0 *අයැදුම්පත්‍ර* .– ආදර්ශ අයැදුම්පත්‍රයේ අංක 1.0 සිට 5.0 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ඇතුළත් වන පරිදි "ඒ 4" ප්‍රමාණයේ කඩදාසිවල අයැදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අයැදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයැදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයැදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයැදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයැදුම්පතක් පමණක් වන අතර අයැදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයැදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයැදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයැදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයැදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තවද, සම්පූර්ණ කරනු ලබන අයැදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයැදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරින් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 400 ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 200ක් ද විභාග ගාස්තු වශයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

8.0 අයැදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයැදුම් පත්‍රය හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ පිටපතක් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

9.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට

නිලධාරින්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුනු නිලධාරින්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11.0 තමන් කැමතිනම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරින්ට හැකිය. එසේකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබාගත යුතු වේ. (වැඩි විස්තර සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 5:2 ඡේදය බලන්න.)

12.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරින් විසින් තමන්ගේ අයැදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කළ යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතුය.

13.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන අතර, විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කිරීමට කටයුතු කරනු ඇත.

14.0 *විභාග පරිපාටිය* : අපේක්ෂකයින් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය :-

| *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|
| 1. කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | 100 යි | පැය 02 යි | 01 |
| 2. රජයේ කාර්යාලවල භාවිත වන ගිණුම් ක්‍රම | 100 යි | පැය 02 යි | 02 |
| එකතුව | 200 යි | | |

14.1 ***කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය :***

රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව යොදාගැනීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. –

I වැනි කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය විනාඩි 30 යි. ලකුණු 25 යි.

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය විනාඩි 90 යි. ලකුණු 75 යි.

14.2 ***රජයේ කාර්යාලවල භාවිතවන ගිණුම් ක්‍රම :***

රජයේ කාර්යාලවල භාවිතවන ගිණුම් ක්‍රම, ගිණුම් පාලන පොත්පත් හා ඒ සම්බන්ධව නිකුත් කර ඇති භාණ්ඩාගාර මුල්‍ය උපදෙස් හා නියෝග පිළිබඳ දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. :-

I වැනි කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය විනාඩි 30 යි. ලකුණු 25 යි.

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය විනාඩි 90 යි. ලකුණු 75 යි.

15.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2011 ජූලි මස 18 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

**ආදර්ශ අයැදුම්පත්‍රය**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010 (II), (2011)
Efficiency Bar Examination for Officers in Class II of Public Management Assistants' Service- 2010 (II), (2011)

(මෙම විභාග නිවේදනය අනුව අයැදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ *ඒකාබද්ධ සේවයට අයත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ* II වැනි පන්තියේ නිලධාරින් පමණි.)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

*ගැසට් නිවේදනයේ* 2.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය :
(මෙය පසුව වෙනස්කිරීමට ඉඩදෙනු නොලැබේ.)

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| 1. | |
| 2. | |

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

---

1.0 1.1 මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
*උදා* :- SILVA, M. A.

1.2 මුලකුරු සමඟ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුල්'කුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 මුල්'කුරුවලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය :————.

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1
පුරුෂ - 0 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

5.0 ඔබ මෙවර ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

| විෂයයන් | විෂයය අංකය |
|---|---|
| | |
| | |

6.0 දැනට දරන තනතුර :

6.1 තනතුර :————.

6.2 පත්වීම් ලිපියේ අංකය :————.

6.3 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියට පත් වූ දිනය :————.

7.0 7.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

7.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.

7.3 ලදුපත ඇලවීම සඳහා :

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

8.0 *අයැදුම්කරුගේ සහතිකය* :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. රුපියල් ............... ක විභාග ගාස්තුව ................. තැපැල් කාර්යාලයකට ......... දින ගෙවා ලබාගත් ලදුපත ඉහත අලවා ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධි විධානයන්ට මම යටත්වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන*.– තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..................... මහතා/මහත්මිය/මෙනවිය ..................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,

(ii) මෙම නිලධාරියා/නිලධාරිණිය* ඒකාබද්ධ සේවයට අයත් බවත්,

(iii) නිලධාරියා/නිලධාරිණිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/නොසිටි* බවත්,

(iv) නිලධාරියා/නිලධාරිණිය* මෙයට පෙර විභාගයට පෙනී සිට ඇති නිසා නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,

(v) නිලධාරියා/නිලධාරිණිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අනවශ්‍ය දෑ කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

08-120

**යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත**
**ආධුනිකයින් බඳවා ගැනීම - 2012 වසර**

ජපන් - ශ්‍රී ලංකා සහයෝගීතාවය මත ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මකවන මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2012 වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු 16 නොඅඩු 25ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අයදුම්පත් කැඳවනු ලබන පූර්ණ කාලීන පාඨමාලා

| *පාඨමාලා* | *කාලය* | *බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 1.1 මෝටර් රථ කාර්මික ශිල්පී Automobile Mechanic | අවු. 03 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ (මාධ්‍ය භාෂාව), ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. (සැ. යු. : ගණිතය I, II සහ විද්‍යාව I, II සමත් අයදුම්කරුවන් එය පැහැදිලිව වෙන් වෙන් වශයෙන් අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය.) |
| 1.2 මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී Automobile Electrician | අවු. 03 | |
| 1.3 යන්ත්‍ර ශිල්පී Machinist | අවු. 03 | |
| 1.4 මෝටර් රථ වායු සමීකරණ යාන්ත්‍රික ශිල්පී Automobile A/C Mechanic | අවු. 02 | |
| 1.5 මෝටර් රථ වැද්දුම් ශිල්පී Automobile Tinker | අවු. 1 1/2 | රජයේ හෝ රජය විසින් පිළිගන්නා ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත් වී තිබීම |
| 1.6 මෝටර් රථ පින්තාරු ශිල්පී Automobile Painter | අවු. 1 1/2 | |

2. වයස :

2012.01.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි විය යුතු ය.

3. *පාඨමාලා පුහුණු විස්තර* :

3.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) යටතේ වූ නිපුණතා පාදක පුහුණු ක්‍රමය සහ ද්විත්ව පුහුණු ක්‍රමය අනුව සියලුම පාඨමාලා පැවැත්වේ.

3.2 ඒ අනුව 1.1 සිට 1.4 දක්වා වූ පාඨමාලාවල පළමු වසරේ ආයතනික පුහුණුවේ දී ලබාගත් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ දෙවන හා තුන්වන වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන ප්‍රධාන කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.3 1.5 සහ 1.6 පාඨමාලා සඳහා පුහුණුවේ පළමු මාස 06 ආයතනය තුලදී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව ලබාදෙන අතර ඉතිරි වසර කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.4 යන්ත්‍ර ශිල්පී පාඨමාලාවට ලියවන පට්ටල් සහ මිලින් යන්ත්‍ර ඇතුලුව මූලික යන්ත්‍රවලට අමතරව මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයට අයත් හෙඩ් ෆේසින්, බෝරිං, හෝනින්, ක්‍රැන්ක් ග්‍රයින්ඩින් සහ ටූල් කටර්, ග්‍රයින්ඩින් යන සියලුම යන්ත්‍රවල පුහුණුව ඇතුලත්ව 3.2හි සඳහන් පරිදි පුහුණු කෙරේ.

4. *පාඨමාලා කාලය තුල ලබාදෙන ප්‍රතිලාභ* :

4.1 ආයතනික පුහුණු කාලය තුල රු. 1,000 ක මාසික ආධුනිකත්ව දීමනාවක් සහ වැඩහල් නිල ඇඳුමක් ලබාදේ;

4.2 තෝරාගනු ලබන ආර්ථික අපහසුතාවන් ඇති ආධුනිකයින්ට ශිෂ්‍යාධාර ලබාදේ;

4.3 පාඨමාලා කාලය තුල ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම ලබා දේ;

4.4 පුස්තකාල පහසුකම්/අධ්‍යාපන චාරිකා.

5. *ආධුනිකත්ව ගිවිසුම* :

5.1 තෝරා ගනු ලබන සෑම ආධුනිකයෙක්ම විසින්ම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය සමඟ ආධුනිකත්ව ගිවිසුමකට එළඹිය යුතු ය. ආයතනයේ විනය නීති රීතිවලට අනුව සතුටුදායක ලෙස පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

6. *සහතිකපත් ප්‍රදානය* :

6.1 සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ජාතික වෘත්තීය සුදුසුකම් අවසාන ඇගයීම් පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින්ට තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ජාත්‍යන්තරව පිළිගත් "ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතිකය" සමඟ මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකයද ප්‍රදානය කරනු ලැබේ.

7. සහතිකපත් ලාභීන්ට ලැබෙන ප්‍රතිලාභ :

7.1 ජාතික වෘත්තීය සුදුසුකම් 5 (ඩිප්ලෝමා සහතිකය) සහ 6 වන (උසස් ඩිප්ලෝමා සහතිකය) මට්ටමේ පාඨමාලා හැදෑරීම සඳහා නැවතත් මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයට ඇතුලත්වීමේ වරම්.,

7.2 ඉන් අනතුරුව ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන (උපාධිය) මට්ටම හැදෑරීම සඳහා වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයට ඇතුලත් වීමේ වරම්,

7.3 දේශීය මෙන්ම විදේශීය රැකියා සඳහා ඇති ඉහළ ඉල්ලුම.

8. *පාඨමාලා සඳහා තෝරා ගැනීම* :

8.1 මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ගණිතය සහ සාමාන්‍ය දැනීම ඇතුලත් පැය 01ක අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවා තෝරා ගැනීම සිදුකරනු ලබයි.

9. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

9.1 මි. මි. 290 x මි. මි. 210 (A4) ප්‍රමාණයේ කඩදාසික පහත සඳහන් උපදෙස් හා ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත, මුද්දරයක් ඇලවූ සහ ඔබගේ ලිපිනය සඳහන් දිග ලියුම් කවරක් සමඟ 2011 සැප්තැම්බර් මස 10 වැනි දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම් පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම 2012" යනුවෙන් සඳහන් කල යුතු ය. අප ආයතනයට පැමිණ ඉල්ලුම්පත් ලබාගත හැකිය. නැතහොත් අපගේ www.aeti.edu.lk වෙබ් අඩවියට පිවිස අයදුම්පත් එවිය හැක.

*අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :*

9.2 අයදුම්කරුගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය ලබාදෙමින් පාඨමාලා තුනක් අයදුම්පතේ 10 වැනි ඡේදයේ සඳහන් කර අයදුම්කල හැකිය.

9.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුව ලබමින් සිටින අයට අයදුම් කළ නොහැක.

9.4 තැපෑලේදී අස්ථානගතවන හෝ ප්‍රමාදවන අයදුම්පත්වලට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග නොකියන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතුව එවන මෙන් දන්වා සිටිනු ලැබේ.

9.5 වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරි, දුරකථන අංක - 011-2572977 හෝ 011-2532182 විමසන්න.

සභාපති, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,

*යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය*
*ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය*
*මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය*

ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2012 වර්ෂය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

01. මුලකුරු සමඟ නම :

02.

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

03. සම්පූර්ණ නම :

| 04. උපන් දිනය | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය

06. ලිපිනය :
දුරකථන අංකය :

07. පරිපාලන දිස්ත්‍රික්කය
ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසය

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති උසස්ම සුදුසුකම් x ලකුණින්)

| 8 වන ශ්‍රේණිය | අ. පො. ස. (සා. පෙ.) | අ. පො. ස. (උ. පෙ.) |
|---|---|---|

09. අ. පො. ස. (සා. පෙ.) විභාග ප්‍රතිඵල

| *සමත් වූ විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* | *සමත්වූ විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|
| 1 ............ | ......... | ...... | 2 ............ | ......... | ...... |
| 3 ............ | ......... | ...... | 4 ............ | ......... | ...... |
| 5 ............ | ......... | ...... | 6 ............ | ......... | ...... |
| 7 ............ | ......... | ...... | 8 ............ | ......... | ...... |
| 9 ............ | ......... | ...... | 10............ | ......... | ...... |
| 11 ............ | ......... | ...... | 12............ | ......... | ...... |

අ. පො. ස. (උ. පෙ) විභාග ප්‍රතිඵල

1 ........................... 3 ...........................
2 ........................... 4 ...........................

10. තෝරා ගනු ලබන පාඨමාලාවන් පිළිවෙලින්

| |
|---|
| 1 |
| 2 |
| 3 |

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුවක් මා නොලබන බවත්, මෙයින් සහතික කරන අතර මෙහි දක්වා ඇති කරුණු අසත්‍ය බවට අනාවරණය වුවහොත්, මම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලාවන් හැදෑරීම සඳහා නුසුදුස්සෙකු වන බවත් හොඳාකාරව දනිමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

08-139

## ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2011 (II)

01. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණ, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය හා මෙහයවීම යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් 2011 ඔක්තෝබර් මස 22 සිට 2011 නොවැම්බර් මස 20 දක්වා සති අන්ත දිනවල කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකි වන පරිදි කාල සටහන් සකස් කරනු ලැබේ.

03. ඉහත සේවාවන්ට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණ පහත සඳහන් පරිදි වේ. :-

| *අනු. අංකය* | *විභාගයේ නම* | *සංකේතය* |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | A |
| 02 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය | B |
| 03 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | C |
| 04 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | D |
| 05 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | E |
| 06 | දෙවැනි භාෂා පරීක්ෂණය (සියලු සේවාවන් සඳහා) | F |

04. තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එසේකුදු වුවත් නියම කර ඇති කාලසීමාව තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම අත්‍යාවශ්‍ය වේ.

05. මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

06. ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතු අතර ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2011 සැප්තැම්බර් මස 05 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

07. *අයදුම්පත්‍ර.*—අංක 1.0 සිට 5.0 දක්වා ඡේදයන් පළමුවැනි පිටුවට ද ඉතිරිය ඊළඟ පිටුවලටද ඇතුළත් වන පරිදි "ඒ 4" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍ර පිළියෙළ කළ යුතු ය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම පිරවිය යුතු ය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ.

7.1 ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කරන්න. තවද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.2 *විභාග ගාස්තු.*—පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට හෝ විෂයයන් එකකට වඩා වැඩි සංඛ්‍යාවකට පෙනී සිටින්නේ නම් රු. 115 ක් ද, එක් විෂයයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු. 75 ක් ද, විභාග ගාස්තු ලෙස ගෙවිය යුතු අතර එම මුදල ලංකා බැංකුවේ නිදහස් චතුරශ්‍ර ශාඛාවේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 02323276 ට බැර කර ලබා ගන්නා රිසිට් පත අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය. මොනම කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

08. අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

09. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. තවද ඉහත ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව කරනු ලබන විමසීම් සලකා බලනු නොලැබේ.

10. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර යම් අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13. *විභාග පරිපාටිය.*—එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් සහ විෂය නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ. :—

13.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (2005.11.14 දිනැති අංක 1419/3 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ "ඇ" පරිශිෂ්ටය)

මෙම විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ. :-

| *අනු. අංකය* | *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 01 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | පැය 03 යි | 01 |
| 02 | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | පැය 03 යි | 02 |
| 03 | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | පැය 03 යි | 03 |
| 04 | පරිපාලනය | පැය 03 යි | 04 |
| 05 | ආර්ථික විද්‍යාව | පැය 03 යි | 05 |
| 06 | සමාජ විද්‍යාව | පැය 03 යි | 06 |
| 07 | ඉංග්‍රීසි | පැය 03 යි | 07 |

13.1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය (විෂය අංකය 01)

පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි.

(i) ඓතිහාසික සංවර්ධනය ද ඇතුලුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හා දෙවැනි ජනරජ ව්‍යවස්ථාව ;
(ii) විධායකය, ජනරජයේ ජනාධිපති, අමාත්‍ය මණ්ඩලය හා අගමැති, මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සේවය ;
(iii) යුක්තිය පසිඳලීම ;
(iv) පරිපාලනය සම්බන්ධ අධිකරණ පාලනය ;
(v) රාජ්‍ය ප්‍රතිපත්තිය උදෙසා මාර්ගෝපදේශ ප්‍රතිපත්ති සහ මූලික යුතුකම් ;
(vi) අභිනියෝජන ව්‍යවස්ථා ;
(vii) රජයේ හා රාජ්‍ය අධිකාරීන් හි වගකීම් ;
(viii) මූලික අයිතිවාසිකම් ;

13.1.2 ශ්‍රී ලංකාවේ නීති ක්‍රම (විෂය අංකය 02)

පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි.

(i) ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය ;
(ii) අධිකරණ සංවිධානය ;
(iii) ශ්‍රී ලංකාවේ උසාවි ආඥාපනත (6 පරිච්ඡේදය) ;
(iv) 1971 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත.

13.1.3 අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය (විෂය අංකය 03)
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි :–
(i) දණ්ඩ නීති සංග්‍රහය ;
(ii) සාක්ෂ්‍ය ආඥාපනත.

*සටහන*.-අපේක්ෂකයකු ඉහත 13.1.1, 13.1.2 සහ 13.1.3 හි සඳහන් එක් එක් විෂයය සඳහා අවම වශයෙන් 35% ක ලකුණු ප්‍රමාණයක් සහ විෂයයන් 03 හි මුළු ලකුණුවලින් 40% ක සාමාන්‍යයක් ලබා ගත යුතු වේ.

13.1.4 පරිපාලනය (විෂය අංකය 04)
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි :–
(i) කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම ;
(ii) ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද
I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII

*සටහන*.-මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

13.1.5 ආර්ථික විද්‍යාව (විෂය අංකය 05)/සමාජ විද්‍යාව (විෂයය අංකය 06)
අපේක්ෂකයන් ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට පමණක් පෙනී සිටිය යුතුය.

13.1.5.1 ආර්ථික විද්‍යාව (විෂයය අංකය 05)
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි :–
(i) වටිනාකම, නිෂ්පාදනය හා බෙදා හැරීමේ න්‍යායන් පිළිබඳ විශේෂ අවධානයක් සහිතව ආර්ථික විද්‍යාවේ මූලධර්ම ;
(ii) මුදල්, මූල්‍ය කටයුතු හා මුදල් න්‍යාය ;
(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය.

*සටහන*.-මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

13.1.5.2 සමාජ විද්‍යාව (විෂයය අංකය 06)
ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ අවධානය සහිතව පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි.
(i) සමාජ ව්‍යුහය, සංවිධානය හා කාර්යයන් ;
(ii) මානව සම්බන්ධතා හා කණ්ඩායම් ;
(iii) බන්ධුත්වය, විවාහය හා පවුල ;
(iv) ග්‍රාමීය හා නාගරික සමාජය ;
(v) සමාජ ස්ථරායනය හා විභේදනය ;
(vi) සමාජයීය පාලනය ;
(vii) සංස්කෘතිය, ආගම, සදාචාරය හා හරපද්ධතීන්.

*සටහන*.-මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

13.1.6 ඉංග්‍රීසි (විෂයය අංකය 07)

මෙම විෂයය සඳහා අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.

(i) *Listening and Speaking Skills*.—The candidate should possess the ability to function effectively in the following language functions :–

* General Greetings and Introductions ;
* Giving and Getting information ;
* Advising, Suggesting and Expressing Opinions ;
* Describing Events and Situations ;
* Telephone skills ;
* Interviewing skills ;
* Meeting ;
* Listening and Note Taking skills ;

(ii) *English Grammar.*—A suitable level of proficiency on the following forms of grammar in the Spoken the Written language is expected from the candidate. : –
* Tense and Number ;
* Sentences (Simple/Compound/Complex/Compound Complex) ;
* Relative Clauses ;
* Reported Speech ;
* Adjectives and Adverbs ;
* Determiners ;
* Prepositions.

(iii) *Writing Skills.*—The knowledge on the modern formats and styles of writing is tested in this area of study : –
* Internal modes of Communication ;
* Formal Correspondence skills ;
* Writing Descriptions/Explanations ;
* Summary writing skills ;
* Report Writing skills ;
* Meeting Minutes/Agendas/Invitations ;
* Comprehension.

(iv) *Reading Skills.*—Candidate's ability to comprehend a printed text, infer meaning and verbal/written interpretation is expected :–
* Reading and understanding the specific and general meaning of a printed text ;
* Reading and Interpretation (verbal/written) ;
* Understanding the cohesion and coherence of a passage.

සටහන.-මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

13.2 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (2005.11.14 දිනැති අංක 1419/3 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ "ඈ" පරිශිෂ්ටය)

මෙම විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ. :-

| *අනු. අංකය* | *විෂයය* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01 | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 08 |
| 02 | සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 09 |
| 03 | කළමනාකරණය හා සංවිධාන ක්‍රම | පැය 03 යි | 10 |
| 04 | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පැය 03 යි | 11 |

13.2.1. *ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය 08)*

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා බලපාන කරුණු මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි. ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික, සමාජ හා දේශපාලන ඉතිහාසය තුළ ආර්ථික විද්‍යා සහ සමාජ විද්‍යා මූලධර්මයන් උපයෝගී කරගත් ආකාරය පිළිබඳ කරුණු මත මෙම ප්‍රශ්න පත්‍රය සකස් වී ඇත.

සටහන.-මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.2.2 *සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂය අංකය 09)* :

ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානයක් සහිතව පහත කරුණු පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් සංවර්ධන පරිපාලනය භාර වූ ආයතන, ඒවායේ ක්‍රියාකාරිත්වය හා අන්තර් සම්බන්ධතාවයන් මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි :–

(i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රය;
(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පසුබිම;
(iii) පළාත් සභා හා පළාත් පාලන;
(iv) මහජන සංවිධාන;
(v) රාජ්‍ය සංස්ථා.

සටහන.-මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.2.3 *කළමනාකරණය හා සංවිධාන ක්‍රම (විෂයය අංකය 10)*

පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :—

(i) කළමනාකරණය හා සංවිධානය පිළිබඳ මූලධර්ම;
(ii) එම මූලධර්ම රාජ්‍ය අංශයේ පැන නගින ගැටලු හා ප්‍රශ්නවලට අදාළ කර ගැනීම;
(iii) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්ප ක්‍රම.

සටහන.-මෙම විෂයය සඳහා අපේක්‍ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.2.4 *රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (විෂයය අංකය 11)*
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :—
(i) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය-
රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන
රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය
අරමුදල් යන්නෙහි අර්ථය
ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය
විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම
අවිනිශ්චිත අවස්ථා අරමුදල
වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරිත්වය
රාජ්‍ය ආදායම
මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය
වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය
විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය
රාජ්‍ය වියදම් කමිටුව
රාජ්‍ය ව්‍යාපාර කමිටුව
(ii) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්යභාරය
(iii) අභ්‍යන්තර විගණනය
(iv) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය. :—
සංවිධානවල අරමුණු හා කාර්ය භාරයන් හඳුනාගැනීම
රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩ සටහන් හඳුනාගැනීම
සංවර්ධන ව්‍යාපෘති, වැඩ සටහන් සැලසුම් කිරීම හා ඇගයීම හා ප්‍රමුඛතාකරණය
වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම

(v) අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම :—
වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම
රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය
මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම
පරිපූරක ඇස්තමේන්තු
(vi) රජයේ දේපලවල පාඩු හා අත්හැරීම්
(vii) විවිධ ගිණුම් කටයුතු
(viii) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්ය භාරයන් පැවරීම
(ix) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය
(x) රජයේ සැපයුම් ක්‍රියා පරිපාටිය
භාණ්ඩ සේවා හා වැඩ ලබා ගැනීම
ටෙන්ඩර් මණ්ඩල හා තාක්‍ෂණ ඇගයුම් කමිටුවල සංයුතිය
පත්කිරීම බලතල හා කාර්යභාරය
ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියා පරිපාටිය
විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කළමනාකරණය

සටහන.-මෙම විෂයය සඳහා අපේක්‍ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

13.3 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය

මෙම විභාගයන් සඳහා වන විෂයයන් පහත දැක්වේ. :—

| *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|
| මූල්‍ය ක්‍රම | පැය 03 යි | 12 |
| පරිපාලනය | පැය 03 යි | 04 |

13.3.1 *මූල්‍ය ක්‍රම (විෂයය අංකය 12)*
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :—

(i) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර)
(ii) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තු උදා : ඒවා සකස් කිරීම, ශීර්ෂ, මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්

සටහන.-මෙම විෂයය සඳහා අපේක්‍ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු ය.

13.3.2 *පරිපාලනය (විෂයය අංකය 04)*
මෙම විෂයයට අදාළ විෂය නිර්දේශය 13.1.4 ඡේදයෙහි දැක්වේ.

13.4 දෙවන භාෂා පරීක්‍ෂණය (සියලු සේවා සඳහා)
සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සම්බන්ධයෙන් දෙවන භාෂාව දෙමළ භාෂාව වන අතර දෙමළ මාධ්‍යයෙන් සේවයට පත්කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සම්බන්ධයෙන් දෙවන භාෂාව සිංහල භාෂාව වේ. ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සිංහල හා දෙමළ යන භාෂා දෙක පිළිබඳ පරීක්‍ෂණවලින් සමත් විය යුතුය.

මෙම විභාගයන් සඳහා වන විෂයයන් පහත දැක්වේ. :—

| *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|
| දෙවන භාෂා පරීක්‍ෂණය - සිංහල (ලිඛිත) | පැය 02 යි | 13 |
| දෙවන භාෂා පරීක්‍ෂණය - දෙමළ (ලිඛිත) | පැය 02 යි | 14 |
| දෙවන භාෂා පරීක්‍ෂණය - ඉංග්‍රීසි (ලිඛිත) | පැය 02 යි | 15 |

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| දෙවන භාෂා පරීක්‍ෂණය - සිංහල (වාචික) | 16 |
| දෙවන භාෂා පරීක්‍ෂණය - දෙමළ (වාචික) | 17 |
| දෙවන භාෂා පරීක්‍ෂණය - ඉංග්‍රීසි (වාචික) | 18 |

සටහන.—දෙවන භාෂා පරීක්‍ෂණයේ ලිඛිත විභාගය සමත් වන අයදුම්කරුවන් පමණක් වාචික පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ.

14. මෙම විභාගය 2011 ඔක්තෝබර් මස 22 වැනි දින සිට 2011 නොවැම්බර් මස 20 වැනි දින දක්වා කොළඹ දී පැවැත්වෙන අතර විභාග කාල සටහන පහත පරිදි වේ. :—

| *අනු. අංකය* | *විභාගයේ නම* | *විෂයය* | *විෂය අංකය* | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | 01 | 2011.10.22 | 9.00 - 12.00 |
| | | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | 02 | 2011.10.22 | 12.30 - 3.30 |
| | | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | 03 | 2011.10.23 | 9.00 - 12.00 |
| | | පරිපාලනය | 04 | 2011.10.23 | 12.30 - 3.30 |
| | | ආර්ථික විද්‍යාව | 05 | 2011.11.05 | 9.00 - 12.00 |
| | | සමාජ විද්‍යාව | 06 | 2011.11.05 | 9.00 - 12.00 |
| | | ඉංග්‍රීසි | 07 | 2011.11.05 | 12.30 - 3.30 |
| 02 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති | 08 | 2011.11.12 | 9.00 - 12.00 |
| | | සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය | 09 | 2011.11.12 | 12.30 - 3.30 |
| | | කළමනාකරණය හා සංවිධාන ක්‍රම | 10 | 2011.11.13 | 9.00 - 12.00 |
| | | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | 11 | 2011.11.13 | 12.30 - 3.30 |

| අනු. අංකය | විභාගයේ නම | විෂයය | විෂය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 03 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2011.11.19 | 9.00 - 12.00 |
| | | පරිපාලනය | 04 | 2011.10.23 | 12.30 - 3.30 |
| 04 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2011.11.19 | 9.00 - 12.00 |
| | | පරිපාලනය | 04 | 2011.10.23 | 12.30 - 3.30 |
| 05 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2011.11.19 | 9.00 - 12.00 |
| | | පරිපාලනය | 04 | 2011.10.23 | 12.30 - 3.30 |
| 06 | දෙවන භාෂා පරීක්ෂණය (අදාළ සියලු සේවා සඳහා) | සිංහල (ලිඛිත) | 13 | 2011.11.20 | 2.00 - 4.00 |
| | | දෙමළ (ලිඛිත) | 14 | 2011.11.20 | 9.00 - 11.00 |
| | | ඉංග්‍රීසි (ලිඛිත) | 15 | 2011.11.20 | 11.30 - 1.30 |

15. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට අදාළ විෂයයන්ගේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම පහත පරිදි වේ. :—

| විභාගය | විෂයය | නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම් |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය. ශ්‍රී ලංකාවේ නීති ක්‍රම අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | බැරිස්ටර්වරයකු, ශ්‍රේෂ්ඨාධිකරණයේ අධි නීතිඥවරයකු, විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියකු වීම |
| | ආර්ථික විද්‍යාව/සමාජ විද්‍යාව | ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳව විශේෂ උපාධිධාරියකු වීම |

16. මෙම විභාග නිවේදනයට විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2011 ජූලි මස 21 වැනි දින,
කොළඹ 07.
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2011 (II)

Efficiency Bar Examination and Second Language Proficiency Test for Officers in Sri Lanka Administrative Service, Sri Lanka Engineering Service, Sri Lanka Scientific Service and Sri Lanka Architects' Service - 2011 (II)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2,
දෙමළ - 3,
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) (මෙය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : SILVA, A. B.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය ඃ
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය ඃ වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 ජාතික හැඳුනුම්පත් අංකය ඃ | | | | | | | | | | |

4.0 4.1 ඔබ අයත් සේවය :————.
4.2 එම සේවයට පත් කරනු ලැබූ දිනය :————.

5.0 5.1 තනතුර :————.
5.2 දෙපාර්තමේන්තුවේ නම :————.

6.0 ඔබ ඉල්ලුම් කරන විභාගයන් සහ ඉදිරිපත් වන විෂයයන් ඃ (ඔබ විභාගයන් කිහිපයකට ඉදිරිපත් වන්නේ නම් පහත සඳහන් පරිදි වෙන වෙනම සඳහන් කරන්න.)

6.1 විභාගයේ නම :————. සංකේතය :————.
(විභාග නිවේදනයේ 3.0 ඡේදය බලන්න.)

| අනු. අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

6.2 විභාගයේ නම :————. සංකේතය :————.
(විභාග නිවේදනයේ 3.0 ඡේදය බලන්න.)

| අනු. අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

6.3 විභාගයේ නම :————. සංකේතය :————.
(විභාග නිවේදනයේ 3.0 ඡේදය බලන්න)

| අනු. අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

7.0 මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට තිබේද ? :————.
පෙනී සිට තිබේ නම් පහත විස්තර සඳහන් කරන්න.

| විභාගයේ නම | විෂයය | වර්ෂය | මාසය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

8.0 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද?

8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු පිළිබඳ පහත තොරතුරු සඳහන් කරන්න. :—

ගෙවන ලද මුදල :————.
රිසිට්පත් අංකය :————.
ගෙවීම් කළ දිනය :————.
ලංකා බැංකු ශාඛාව :————.

මුදල් ගෙවූ රිසිට් පත නොගැළවෙන සේ මෙහි අලවන්න.

**අයදුම්කරුගේ ප්‍රකාශය**

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. නියමිත විභාග ගාස්තු ගෙවූ බැංකු රිසිට්පත මේ සමඟ අමුණා ඇති බවත් සහතික කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් පනවනු ලබන නීතිරීතිවලට ද මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————.
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙහි විස්තර දැක්වෙන ........................මහතා/මහත්මිය/මෙනෙවිය හට මෙම විභාගයට පෙනී සිටීමටත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමටත් සුදුසුකම් ඇත.

අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන සහතික කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා තනතුර.

දිනය :————.

08-176

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2011**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 2011.08.05 | සිකුරාදා | 2011.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.12 | සිකුරාදා | 2011.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.19 | සිකුරාදා | 2011.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.26 | සිකුරාදා | 2011.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2011.09.02 | සිකුරාදා | 2011.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.09 | සිකුරාදා | 2011.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.16 | සිකුරාදා | 2011.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.23 | සිකුරාදා | 2011.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.30 | සිකුරාදා | 2011.09.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2011.10.07 | සිකුරාදා | 2011.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.14 | සිකුරාදා | 2011.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.21 | සිකුරාදා | 2011.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.28 | සිකුරාදා | 2011.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.